# ඉර වටා පොළොව නොයෑමට හේතුව

බටහිර විද්‍යාව මානව කේන්ද්‍රීය වෙයි. එහෙත් මෙහි දී මානව කේන්ද්‍රීය යන්නෙන් අදහස් කෙරෙන්නේ ලොවෙහි වසන සියළු මිනිසුන් නොවේ. මුල් යුදෙව් චින්තනයෙහි යුදෙව්වෝ තෝරා ගනු ලැබූ මිනිස්සු වූහ. අද වන විට තෝරා ගනු ලැබුවෝ බටහිරයෝ ය. ඉනුදු බටහිර සුදු පිරිමි තෝරා ගනු ලැබුවෝ වෙති. ඒ වත්මන් බටහිර චින්තනය වූ යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට මුල් යුදෙව් චින්තනයෙහි අංග ඇතුළත් වීමෙහි ප්‍රතිඵලයකි. කෙසේ හෝ වේවා බටහිර විද්‍යාව බිහිවන්නේ යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය තුළ බැවින් එය බටහිර සුදු පිරිමි කේන්ද්‍රීය විද්‍යාවක් වෙයි. බටහිර චින්තනයෙහි ඇති මේ ස්වභාවය හේතුකොට ගෙන බටහිර කාන්තා විමුක්තිය පවා සුදු පිරිමි කේන්ද්‍රීය වෙයි. බටහිර සුදු ගැහැණුන්ට හා ඔවුන් අනුකරණය කරන ලොවෙහි අනෙක් ගැහැණුන්ට අවශ්‍ය වී ඇත්තේ ගැහැණුන් ලෙස ගරුත්වයක් ඇතිව තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් පිරිමින් ද ඔවුන්ගේ යුතුකම් හා වගකීම් ඉටු කරන ලෝකයක ජීවත් වීමට නොව බටහිර සුදු පිරිමින් මෙන් ජීවත් වීමට ය. බටහිර කාන්තා විමුක්ති අරගලය යනු බටහිර පිරිමින් භුක්ති විඳින වරප්‍රසාද තමන්ට ද ඉල්ලමින් ගැහැණුන් කරන අයිතිවාසිකම් සටනකි. එය ද සිදු වන්නේ ඉල්ලීම, යාඥාව ආදිය ද ඇති යුදෙව් චින්තනය තුළ පදනම් වෙමිනි.

බටහිර විද්‍යාව බිහිවූයේ ම බටහිර නූතනත්වය තුළ ය. බටහිර නූතනත්වය ඇති වීමට පෙර බටහිර වූයේ කතෝලික චින්තනය ය. කතෝලික චින්තනයෙහි සමස්තය යන්න ඇති බව අපි කලින් සඳහන් කර ඇත්තෙමු. කතෝලික චින්තනයෙහි ද යම් ප්‍රමාණයකට මුල් යුදෙව් චින්තනය වෙයි. ක්‍රිස්තියානි ව්‍යාපාරය යනුවෙන් මා හඳුන්වන යුදෙව් ආගමෙන් හා යුදෙව්වන්ගේ පාරිසි පූජකයන්ගෙන් කැඩී යෑමේ ක්‍රියාදාමය යුදෙව්වන් අතර ම ඇරඹී ඇත්තේ ක්‍රිස්තු වර්ෂයෙන් පෙර තුන්වැනි සියවසේ පමණ ය. පාරිසි පූජකයන්ට විරුද්ධ ව යුදෙව්වන් අතර ම මේ ව්‍යාපාරය පැන නැගීමට එවකට යුදෙව්වන් අවට සිටි ජනතාවන්ගේ චින්තන බල පෑ බවට සැකයක් තිබිය හැකි නොවේ. යුදෙව්වන් මේ අනෙක් ආගම් හැඳින්වූයේ අසද්ධර්මසේවී (පේගන්) ආගම් ලෙස ය. පසු කලෙක යුදෙව්, ක්‍රිස්තියානි, කතෝලික, ඉස්ලාම් ආගම් නොවන, එනම් පරණ තෙස්තමේන්තුව මුල් කර ගත් ආගම් නොවන, ආගම් හැඳින්වීම සඳහා මේ වචනය යොදා ගැණිනි. යුදෙව්වන් අතර උත්පත්තිය ලැබූ ක්‍රිස්තුස් වහන්සේ මේ ක්‍රිස්තියානි ව්‍යාපාරයට එක් කලෙක දී නායකත්වය දුන්නේ යැයි සිතිය හැකි ය. යුදෙව්වෝ විශේෂයෙන් ම පාරිසි පූජකවරු නව ව්‍යාපාරයට තදින් ම විරුද්ධ වූහ. අළුත් තෙස්තමේන්තුවේ ක්‍රිස්තුස් වහන්සේ පාරිසි පූජකයන්ට විරුද්ධව කළ දෑ ගැන ද සඳහන් වෙයි. ක්‍රිස්තුස් වහන්සේ මෙන් ම උන් වහන්සේ අනුගමනය කළ අය ද යුදෙව්වන්ගේ තාඩන පීඩනවලට ලක් වූහ. ක්‍රිස්තියානි ව්‍යාපාරය යුරෝපයෙහි ජයග්‍රහණය කෙළේ ක්‍රිස්තු වර්ෂයෙන් හතරවැනි සියවසෙහි ය. රෝමයේ රජ වූ කොන්ස්තන්තයින් රජු ක්‍රිස්තියානි ආගම වැළඳ ගෙන ක්‍රිස්තු වර්ෂ තුන්සිය පහළොවෙහි එය රෝමයෙහි රාජ්‍යාගම බවට පත් කෙළේ ය. එය මුළු මහත් යුරෝපය පමණක් නොව අවසානයෙහි දී මුළු මහත් ලෝකයම මහා වෙනසකට භාජනය කළ සිද්ධියක් විය.

ක්‍රිස්තියානි ආගම බිහි වී ඇත්තේ යුදෙව් ආගමෙහි මෙන් ම වෙනත් මධ්‍යධරණී ආගම්වල ද කොටස් එකතු කර ගනිමිනි. වක්‍ර ව හෝ ඍජු ව හෝ භාරතීය ආගම් ද යම් ප්‍රමාණයකට එයට බලපා තිබෙන බව පැහැදිලි ය. මෙසේ සඳහන් කිරීම ගැන කතෝලික හා ක්‍රිස්තියානි බැතිමතුන් මා සමග උරණ විය යුතු නොවේ. කිසිම ආගමක්, චින්තනයක් හෝ සංස්කෘතියක් අනෙක් ආගම්වලින්, චින්තනවලින් හා සංස්කෘතීන්ගෙන් මුළුමනින්ම ස්වාධීන වන්නේ නොවෙයි. බුදු දහම වෛදික ආගම්වලින් මෙන් ම වෛදික ආර්ය චින්තනය භාරතයට පැමිණීමට පෙර එහි තිබූ චින්තනයෙන් හා ආගම්වලින් ද ආභාසය ලබා ඇත. කර්මය, පුනරුත්පත්තිය පමණක් නොව පන්සිල් හා චතුස්කෝටික න්‍යාය ද බුදුන්වහන්සේට පෙර ඉන්දියාවේ විය. මේ පරිසරය නොමැතිව බුදු දහම ව්‍යාප්ත වීමට ඉඩක් නැත. බෝසතාණන් වහන්සේ සිදුහත් කුමරු ලෙස ඉපදෙන්නට පෙර පස්මහ බැලුම් බලා ඇතැයි සඳහන් වෙයි. ඉන් කියැවෙන්නේ ලොව්තුරා බුදු වීමට සුදුසු පරිසරයක එතුමන් උපත ලැබූ බව ය. බෝසතාණන් වහන්සේ ඇස්කිමෝවරයකු ලෙස ඉපදිණි නම් බුදු නොවීමට ඉඩ තිබුණි. පාරමීදම් පිරීම හේතුකොට ගෙන බුදු වුණ ද උන්වහන්සේ පසේ බුදුන් වහන්සේ කෙනකු වීමට තිබුණි. තමන් වහන්සේ නිවන් අවබෝධ කරගෙන එහෙත් කර්මයක් පුනරුත්පත්තියක් නොදත් ඇස්කිමෝවරුන්ට නිවන් අවබෝධ කරවීමට නොහැකිව උන්වහන්සේ පිරිනිවන් පෑමට ඉඩ තිබුණි. ඇතැම් විට පසේ බුදුන් වහන්සේලා පහළ වන්නේ එවැනි පරිසරවල විය හැකි ය.

© Prof. Nalin De Silva

ක්‍රිස්තියානි ආගමට අනෙක් ආගම්වලින් බොහෝ දෑ එකතු වී ඇත. එහෙත් එහි මධ්‍යයෙහි ඇත්තේ යුදෙව් ආගම බව පැහැදිලි ය. දෙවියන් වයන්සේ ලෝකය මැවීම පිළිබඳ උත්පත්ති කතාව ක්‍රිස්තියානි ආගම ගන්නේ යුදෙව්වන්ගෙනි. එසේ වුවත් ක්‍රිස්තියානි ආගමේ දෙවියන් වහන්සේ යුදෙව් දෙවියන් වහන්සේ ම නොවෙති. යුදෙව් දෙවියන් වහන්සේ යනු ඉතා වියුක්ත සංකල්පයකි. යුදෙව් දෙවියන් වහන්සේ ලෝකය මවා ලෝකයෙන් වෙන් වූහ. මේ දෙවියන් වහන්සේගේ ස්වරූපය ගැන යුදෙව්වන් කිසිවක් නොදත්තේ යැයි කීම නිවැරදි යැයි සිතමි. පරණ තෙස්තමේන්තුවට හෙවත් පරණ ගිවිසුමට අනුව යුදෙව් දෙවියන් වහන්සේ, එනම් යෙහෝවා දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ උන්වහන්සේගේ ප්‍රතිබිම්බය (ඉමේජ්) පරිදි ය. ඒ හැරෙන්නට දෙවියන් වහන්සේගේ ස්වරූපය කුමක්දැයි යුදෙව්වෝ නොදැන සිටියහ. දෙවියන් වහන්සේ කෙතරම් වියුක්ත සංකල්පයක් දැයි කිවහොත් ඒ සිතින් මවා ගත හෝ නොහැකි විය. ඒ පිළිබඳ චිත්ත රූපයක් පවා ඇති කර ගැනීමට නොහැකි විය. යුදෙව් ආගමේ මෙන් ම පරණ ගිවිසුම මුල් කරගෙන බිහි වූ ඉස්ලාම් ආගමේ ද දෙවියන් වහන්සේ (අල්ලා දෙවියන් වහන්සේ) ගැන චිත්ත රූප මවා ගැනීමට නොහැකි ය. එය තහනම් වෙයි. එබැවින් මේ කිසිම ආගමක දෙවියන් වහන්සේගේ ප්‍රතිමා තැනීමක් හෝ උන්වහන්සේගේ චිත්‍ර ඇඳීමක් හෝ සිදු නොවෙයි. මේ ආගම් ප්‍රතිමා තැනීමට කෙතරම් විරුද්ධ ද යතහොත් ඒ ආගම් අදහන්නෝ වෙනත් ආගම්වල ප්‍රතිමා තැනීමට ද විරුද්ධ වූහ! ඒ නිසා ම පරණ ගිවිසුමේ අනු දැන ඇති ආකාරයට මේ ආගම් අදහන්නෝ එකල අනෙක් ආගම්වල පිළිම කඩා බිඳ විනාශ කළහ.

ක්‍රිස්තියානි ආගම මේ තත්වය යම් දුරකට වෙනස් කෙළේ ය. ඒ වෙනස දැන ගැනීමට අවශ්‍ය වන්නේ බටහිර විද්‍යාව හා එයට පසුබිම් වූ නූතනත්වය, කතෝලික චින්තනය තුළ පහළ නොවීමට හේතු සාධක වූ කරුණු අධ්‍යයනය කිරීමට යැමෙහි දී ය. පොළොව ඉර වටා යන බව භාරතීයයන් බොහෝ කාලයක් තිස්සේ දැන ගෙන සිටිය ද යුරෝපීයයන් ඒ බව දැන ගත්තේ කොපර්නිකස් නම් පෝලන්ත ජාතික විද්වතාගෙන් පසුව ය. ඔහු නැගෙනහිර යුරෝපීය ක්‍රිස්තියානි පූජකයකු වීම ද අප සටහන් කර ගත යුතු ය. නැගෙනහිර යුරෝපියයෝ බටහිර යුරෝපීයයන්ට වඩා වියුක්ත චින්තනයට ගොදුරු වූවෝ වෙති. මුල් යුදෙව් චින්තනයෙහි වියුක්ත බව වඩාත් ම ඇත්තේ නැගෙනහිර යුරෝපීයයන්ට බව මගේ විශ්වාසය වෙයි. අද පවා බටහිර ගණිතයෙහි, සෛද්ධාන්තික භෞතික විද්‍යාවෙහි (තියරටිකල් ෆිසික්ස්) හා බටහිර සංගීතයෙහි විශේෂිත දක්ෂකම් දක්වන්නෝ බොහෝ විට නැගෙනහිර යුරෝපීය යුදෙව් සම්භවයක් ඇත්තෝ වෙති. බටහිර යුරෝපීයයන් අතර වඩාත් ම වියුක්ත චින්තනයක් ඇත්තේ ජර්මානු යුදෙව්වන්ට බවත් ඔවුන් හා නැගෙනහිර යුරෝපීයයන් අතර සංස්කෘතික සම්බන්ධයක් ඇති බවත් වටහා ගත යුතු වෙයි. ඇල්බට් අයින්ස්ටයින්, ඉතාමත් ම විශිෂ්ට ගණයේ බටහිර ගණිතඥයකු වූ ෆොන් නියුමාන් ආදී විද්වතුන් පමණක් නොව බීත්හෝවන්, චයිකොව්ස්කි වැනි බටහිර සංගීතඥයන් ද, ඩොස්ටොව්ස්කි වැනි වියුක්ත නවකතා කරුවන් ද, හෙගල් හා හයිඩැගර් වැනි දාර්ශනිකයන් ද බිහි වී ඇත්තේ මේ සංස්කෘතික පරිසරයෙහි ය. මොවුහු සියල්ලෝම අති විශිෂ්ටයෝ වූහ. ඒ පිළිබඳ විවාදයක් නැත. එහෙත් එපමණකින් අප මෙරට අහිංසක ජනතාව මුළා කරමින් කාඩ්බෝඩ් අයින්ස්ටයින්ලා හා කාඩ්බෝඩ් බීත්හෝවන්ලා වීමට යත්න දැරිය යුතු නොවේ. අපට යුදෙව් චින්තනය තුළ කාඩ්බෝඩ් මට්ටමින් එහාට යැමට බැරි බව නොදන්නා ජනතාව මුළා කරමින් දැවැන්ත ප්‍රතිරූප ගොඩනගා ගැනීම සිංහලයන්ගේ කියුමක් යොදා ගන්නේ නම් හෙණ ගහන අපරාධයකි.

පොළොව ඉර වටා යන බව කී විට කතෝලික පල්ලිය එයට විරුද්ධ විය. පෝලන්තයේ සිටි කොපර්නිකස් පූජක තුමාගෙන් ඒ බව දැන සිටි ගැලීලියෝ ගැලීලි නම් ඉතාලි ජාතික විද්‍යාඥයාට පොළොව ඉර වටා යන බව ඉගැන්වීම නිසා පල්ලිය වස නියම කෙළේ ය. ගැලීලියෝ විද්වතා මරණයෙන් ගැළවුණේ ඉර පොළොව වටා යන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමෙනි. එහෙත් ඔහු අප්‍රසිද්ධයෙහි කීවේ පොළොව ඉර වටා යන බව ය. කතෝලික පල්ලිය සංස්ථාවක් ලෙස පොළොව ඉර වටා යන බව කීමට විරුද්ධ වූයේ ඇයි? එයට හේතුව දෙවියන් වහන්සේ ලෝකය මවා ඇත්තේ එසේ නොවේ යැයි ඔවුන් විශ්වාස කිරීම ය. එහෙත් ඔවුන්ට එසේ විශ්වාස කිරීමට සිදු වූයේ ඇයි? අද බොහෝ ක්‍රිස්තියානීන් හා කතෝලිකයන් විශ්වාස කරන අන්දමට දෙවියන් වහන්සේ ලෝකය මවා ඇත්තේ පොළොව ඉර වටා යන ආකාරයෙන් යැයි සිතා ගැනීමට එකල කතෝලික පල්ලියේ ප්‍රධානීන්ට නොහැකි වූයේ ඇයි? මේ ප්‍රශ්නයට මා දෙන පිළිතුර නම් කතෝලික චින්තනයෙහි වූ සංයුක්ත භාවය හේතුකොට ගෙන එසේ විණිය යන්න ය.

© Prof. Nalin De Silva

ක්‍රිස්තියානිය බිහිවීමෙහි දී මුල් යුදෙව් චින්තනය හා යුදෙව් ආගම මෙන් ම යුදෙව්වන් විසින් අසද්ධර්මවේදී ආගම් යැයි හඳුන්වනු ලැබූ ආගම් ද බල පෑ බව ඉහත සඳහන් කෙරී ඇත. මේ යුදෙව් නොවන ආගම් බොහොමයක් සංයුක්ත චින්තනයක් මත පදනම් විය. ඔවුන්ගේ දෙවියෝ මිනිසුන් හැසිරෙන ආකාරයට හැසුරුණහ. ඒ දෙවියෝ යුදෙව් දෙවියන් වහන්සේ මෙන් නොව සිතෙන් මවාගත හැකි දෙවිවරු වූහ. ඒ දෙවිවරු මිනිස් ගැහැණුන්ට පෙම් කළහ. දෙවියන්ගේ පුත්‍රයා ලෙස දෙවියන් මිනිස් දියණියකගේ කුසින් බිහිවන කතා ඔවුන් අතර විය. මේ සංයුක්ත චින්තනය ක්‍රිස්තියානි ව්‍යාපාරය කෙරෙහි හා කොන්ස්තන්තයින් රජුගෙන් පසුව කතෝලික ආගමට හා කතෝළික චින්තනයට බලපෑවේ ය. ක්‍රිස්තියානි ව්‍යාපාරයට දෙවියන් වහන්සේ දැක ගැනීමේ අවශ්‍යතාවයක් විය. හුදු වියුක්ත සංකල්පයක් ලෙස නොව මනසින් හා මසැසින් දැකිය හැකි දෙවියන් වහන්සේ කෙනකු මුල් ක්‍රිස්තියානියට අවශ්‍ය විය. මරිය තුමියගේ කුසින් බිහිවූ ජීවමාන ක්‍රිස්තුස් වහන්සේ එයට පිළිතුර විය. ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුතණුවන් පමණක් නොව දෙවියන් වහන්සේ ද විය. ක්‍රිස්තියානි ව්‍යාපාරයෙහි මේ දෙවියන් වහන්සේ යුදෙව්වන්ගේ යොහෝවා දෙවියන් වහන්සේ මෙන් ම ලෝකය මැවුව ද යෙහෝවා දෙවියන් වහන්සේගෙන් වෙනස් විය. යුදෙව්වන්ගේ දෙවියන් වහන්සේ පුත්‍රයා වෙසින් හෝ කිනම් වෙසකින් හෝ මෙලොව උපත නොලැබී ය. කතෝලිකයන්ට මේ දෙවියන් වහන්සේගේ හා උන්වහන්සේගේ මෑණියන්ගේ චිත්‍ර ඇඳීමට, පිළිම ඇඹීමට බාධාවක් නොවී ය. කතෝලික චින්තනයට සියල්ල දැක බලා ගැනීමට, අඩුම තරමින් මනසින් චිත්ත රූප ඇඳ ගැනීමට අවශ්‍ය විය. කතෝලික චින්තනය ඉන්ද්‍රිය ගෝචර ලෝකය වැළඳ ගෙන එය පිටු නොදැක්කේ ය. දෙවියන් වහන්සේ මවා ඇති ලෝකය කතෝලිකයන්ට දෙවියන් වහන්සේ මෙන් ම ඉන්ද්‍රිය ගෝචර විය. පසු කලෙක යුරෝපයේ බිහි වූ ඉන්ද්‍රියානුභූතවාදයෙහි (පොසිටිවිසම්) බීජ අපට මෙහි දැකිය හැකි ය.

අපේ ඉන්ද්‍රියවලට දැනෙන්නේ පොළොව වටා යන ඉරක් මිස ඉර වටා යන පොළොවක් නොවේ. ඉර වටා යන පොළොවක් ඉන්ද්‍රිය ගෝචර ලෝකයට පටහැණි ය. එය සිතෙන් මවා ගත හැකි වුව ද දෑසට පෙනෙන අන්දමට පොලොව වටා යන ඉරක් තිබිය දී ඉර වටා යන පොළොවක් සිතෙන් මවා ගන්නේ කුමකට ද? වියුක්ත චින්තනය ප්‍රතික්ෂෙප කළ කතෝලික චින්තනය ඉර වටා යන පොළොව ද ප්‍රතික්ෂෙප කෙළේ ය. එවැන්නක් දෙවියන් වහන්සේගේ නිර්මාණයක් ලෙස සැලකීම ප්‍රතික්ෂෙප කෙළේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva